**ශීර්ෂය - 217** පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව

---------------------------------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

----------------

### 1.1 මතය

-------

පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2022 ජූනි 15 වන දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2022 ජූලි 07 වන දින ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

--------------------

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

-----------------------------------------------------------------------------------------------

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.3 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරිම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දූර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 වියදම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වැය විෂයයන් 4 ක් සඳහා අධි ප්‍රතිපාදන වෙන් කර තිබූ අතර එම අධි ප්‍රතිපාදන සියයට 18 සිට සියයට 100 දක්වා පරාසයක පැවතුණි. | 2020 වර්ෂයේ කොවිඩ් වසංගත තත්ත්වයට මුළු ලොවම මුහුණ දුන් පසුබිමක **2021** වර්ෂයේ එම වසංගත තත්ත්වය පහව ගොස් සාමාන්‍ය පරිදි ආයතනික කටයුතු සිදුකල හැකිය යන උපකල්පනය මත **2021** වර්ෂයේ අයවැය ඇස්තමේන්තුව සකස්කර ඇත. | ඇස්තමේන්තු තාත්විකව පිළියෙල කිරීමට අවධානය යොමු කළ යුතු බව. |

**2.2** **බැරකම් හා බැදීම්වලට එළඹීම**

-----------------------------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත සටහන්වල ඇතුලත් වැය විෂයයන් 03කට අදාල රු. 401,953 ක බැරකම් මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කල බැරකම් පිළිබඳ ප්‍රකාශයෙහි ඇතුලත් කර නොතිබුණි. | ප්‍රතිපාදිත මුදල ඉක්මවා බැරකම් වලට එළඹීම සිදුවී ඇත. | බැරකම් පිළිබඳ ප්‍රකාශයෙහි සියළු බැරකම් නිවැරදිව ඇතුළත් කළ යුතු බව. |

**2.3** **නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

---------------------------------------------------

| නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **නීති,රීති හා රෙගුලාසිවලට යොමුව** | **අනුකූල නොවීම** | | |
| 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | මානව සම්පත් සංවර්ධන සැලැස්ම චක්‍රලේඛය ප්‍රකාරව පිළියෙල කර නොතිබුණි. | මානව සම්පත් සංවර්ධන සැලැස්ම සකස් කර ඇත. | චක්‍රලේඛයේ විධිවිධානවලට අනුකූලව කටයුතු කළ යුතු බව. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

----------------------------

### 3.1 දැක්ම හා මෙහෙවර

-----------------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ජාතික ප්‍රතිපත්තීන් හා ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව අනාථ, අත්හල හා අසරණ ළමයින් ද නීතිමය ගැටළුවලට යොමු ළමයින් ද සුවිශේෂී කර ගනිමින් සියළු ළමයින්ගේ අයිතිවාසිකම් සුරක්ෂිත කර ගනිමින් ඔවුනට සමාන අවස්ථාවන් උදා කර දීම දෙපාර්තමේන්තුවේ මෙහෙවර වුවද, දෙපාර්තමේන්තුව ආරම්භ වූ 1956 වර්ෂයේ සිට මේ වන විට වර්ෂ 65 ක් ගත වී තිබුණත්, ළමුන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා වන පරිදි විශ්ව ප්‍රඥප්තියට අනුකූලව ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීම හා ඊට අදාළ නීති සම්පාදනය කිරීම මේ දක්වාම ඉටු කර නොතිබුණි. විකල්ප රැකවරණ ප්‍රතිපත්තියක් සඳහා 2019 මාර්තු 06 වන දින කැබිනට් අනුමැතිය ලබාගෙන තිබුණ ද, එම ප්‍රතිපත්තිය 2022 මාර්තු 25 විගණිත දින වන විටත් ප්‍රමාණාත්මක ලෙස ක්‍රියාත්මක කර නොතිබුණි. | විකල්ප රැකවරණ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ පාලාත් ක්‍රියාකාරි සැලසුම් 08 ක් සකස් කරන ලදී.කෑගල්ල, රත්නපුර දිස්ත්‍රික්ක වල සියළුම ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරීන් හා පරිවාස නිලධාරීන් එක්ව සබරගමු පළාත් ක්‍රියාකාරී සැලැස්ම තවදුරටත් වැඩිදියුණු කිරීම සිදුකරන ලද අතර ඉදිරියේදී සෙසු පළාත්වල ක්‍රියාකාරි සැලසුම් සකස් කිරිමට යෝජිතය. පැවති කොවිඩ් 19 වසංගත තත්ත්වය තුල සංචරණ සීමා තුල වැඩසටහන් පැවැත්වීම සඳහා සීමාකිරිම් පැවතිමද මේ සඳහා කල්ගත වීමට හේතුවක් විය. | මෙහෙවරට අනුකූලව ක්‍රියාකිරීම සඳහා ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කල යුතු බව. |

### 3.2 කාර්ය භාරයන් ඉටු නොකිරීම

------------------------------------

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අවදානම් සහිත දරුවන් වෙනුවෙන් ආරක්ෂණ සැලසුම් ක්‍රියාත්මක කිරීම සඳහා | සැලසුම් කළ ආකාරයට වඩා ක්ෂේත්‍රයෙන් ලැබෙන ඉල්ලීම්වලට අදාළ අවශ්‍යතා මත රැකවරණ | දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අරමුණු ළඟා කර ගැනීමට ප්‍රධාන |

| | | | |
|---|---|---|---|
| | සමාලෝචිත වර්ෂය තුළ දරුවන් 400 ක් සඳහා රු.11,670,000 ක ප්‍රතිපාදන සලසා ගෙන තිබුණි. ප්‍රගති වාර්තාව අනුව සමාලෝචිත වර්ෂය අවසානයට රු.11,447,000 ක් වැය කර දරුවන් 374 දෙනෙකු සඳහා පමණක් මෙම සැලසුම් ක්‍රියාත්මක කර තිබුණි. ආරක්ෂණ සැලසුම් සඳහා කරනු ලැබූ ඉල්ලීම් විධිමත්ව ලේඛනගත කර නොතිබීම, ආරක්ෂණ සැලසුම් සඳහා දරුවන් තෝරා ගැනීමේ නිශ්චිත ක්‍රමවේදයක් සකස් කර නොතිබීම, ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත යවන ප්‍රතිපාදන නියමිත කාලය තුළ නියමිත කාර්යය සඳහා යොදා ගනු ලබන්නේ ද යන්න තහවුරු කර නොගැනීම, පසුවිපරම් ක්‍රියාවලියක් නොමැති වීම යනාදී දුර්වලතා මේ සම්බන්ධයෙන් නිරීක්ෂණය විය. | සැලසුම් සංඛ්‍යාව වෙනස්වීමට ලක්වීම නොවැළැක්විය හැකි කරුණකි. | කාර්යභාරයන් ප්‍රමාණවත් පරිදි ක්‍රියාත්මක කළ යුතු බව. |
| (ආ) | දෙපාර්තමේන්තුව විසින් අඩු ආදායම්ලාභී පවුල්වල දරුවන්ගේ අධ්‍යාපන කටයුතු සාර්ථක කර ගැනීම සඳහා කැපකරු දෙගුරු නමින් ශිෂ්‍යත්ව ආධාර වැඩසටහනක් ක්‍රියාත්මක කරනු ලබන අතර,සමාලෝචිත වර්ෂය තුලදී මේ සඳහා රු.16,724,400ක් වැය කර තිබුණි. ආධාර ලබා දිය යුතු දරුවන්ගේ උපරිම වයස, එක් දරුවෙකුට හිමිවන සම්පූර්ණ වාරික ප්‍රමාණය, ආධාර හිමිවන අධ්‍යාපනික හා වෘත්තීය පාඨමාලා කවරේ ද යන්න මෙම ශිෂ්‍යත්ව ආධාර | මෙම ආධාර ලබාදීම සම්බන්ධව අභ්‍යන්තර චක්‍රලේඛ නිකුත් කර ඇති අතර ඒම චක්‍රලේඛ පිළිබඳව සියලු නිලධාරින් දැනුවත් කිරීමද කර අත. ඊට අමතරව විශේෂ අවස්ථාවලදී කොමසාරිස් අනුමැතිය මත අවශ්‍ය සංශෝධන/ වෙනස්වීම් සිදුකරනු ලැබේ. | පළාත් පරිවාස දෙපාර්තමේන්තු වෙත මුදල් යැවීමේ දී ඇස්තමේන්තුවල නිරවද්‍යතාවය පිළිබඳව ප්‍රමාණවත් අවධානයක් යොමු කළ යුතු අතර, පසු විපරම් කිරීම ප්‍රමාණවත් පරිදි සිදු විය යුතු බව. |

| | | | |
|---|---|---|---|
| | ලබාදීමේදි නිශ්චිතව හඳුනා ගෙන නොතිබුණි. | | |
| (ඇ) | විවිධ ආර්ථික හෝ සාමාජීය සාධක පදනම් කොට ගෙන අඛණ්ඩ පාසැල් අධ්‍යාපනයේ නියැලීමට අවස්ථාව නොලැබෙන දරුවන් නැවත පාසැල්ගත කිරීමේ අවශ්‍යතාවය හඳුනාගෙන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව ක්‍රියාත්මක කර තිබුණද එම වැඩසටහන් ප්‍රමාණවත් නොවීම හේතුවෙන් 2021 වර්ෂයේදී ලමුන් 2718 දෙනෙකු පාසැල් හැරගොස් තිබුණි. | ළමුන් පාසල් හැරයාමට දෙපාර්තමේන්තු වැඩසටහන් වල ක්‍රියාත්මකභාවය ප්‍රමාණවත් නොවීම සාධකයක් ලෙස කෙසේ හඳුනාගන්නේද යන්න පැහැදිලි නැත. | අදාල අරමුණු ඉටු කර ගැනීමට ප්‍රමාණවත් පියවරයන් ගත යුතු බව. |
| (ඇ) | දෙපාර්තමේන්තු අනුමත කාර්ය මණ්ඩලයට අයත් ප්‍රාදේශිය ලේකම් කාර්යාල වෙත අනුයුක්ත කර ඇති ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරීන් විසින් ළමයින්ගේ ළමා අයිතිවාසිකම් සමාජය තුළ සහතික කර දීමට කටයුතු කිරීමත්, ළමයින් විවිධාකාර අපයෝජනයන්ට ගොදුරුවන සාධකයන් හඳුනා ගනිමින් එම තත්ත්වයන්ගෙන් දරුවන් අරක්ෂා කර ගැනීමට කටයුතු කිරීම කල යුතුය. එසේ වුවද එම නිලධාරීන් ඉටුකර ඇති කාර්යයභාරය පිලිබඳව දෙපාර්තමේන්තුව විසින් අධීක්ෂණ හා ඇගයීම් කර ඇති බවට විගණනයේදී අනාවරණය නොකෙරුණි. | ඇගයීම් සිදුකල හැකි විශේෂ ක්‍රමයක් හෝ දිරි දීමනා ලබාදීමේ හැකියාවක් රාජ්‍ය සේවය තුල නොමැත. | දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ කටයුතු අධීක්ෂණය හා ඇගයීම කල යුතු බව. |

## 3.3 වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | ගොරකාන, ගල්කණුව පාරේ පිහිටි දෙපාර්තමේන්තුවට අයත් ගොඩනැගිලි කිහිපයක් වර්ෂ ගණනාවක සිට ප්‍රයෝජනයට නොගෙන නිශ්ක්‍රීයව පැවතුණි. | ගොරකාන ගල්කණුව පිහිටි දෙපාර්තමේන්තුවට අයත් ගොඩනැගිල්ල රටේ පැවති ප්‍රබල අවශ්‍යතාවය අනුව කොරෝනා අන්තර් ප්‍රතිකාර මධ්‍යස්ථානයක් ලෙස භාවිතයට ගැනීමට සිදුකළ ඉල්ලීමකට අනුව ලබා දෙන ලදී. | පිළිතුර පිළිගත නොහැක. අදාළ ගොඩනැගිලි භාවිතයට ගැනීමට කල යුතු බව. |

## 4. තිරසර සංවර්ධන අරමුණු ලඟා කර නොගැනීම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| දෙපාර්තමේන්තුව විසින් 2030 තිරසර සංවර්ධන අරමුණු හඳුනාගෙන එම අරමුණු සම්බන්ධයෙන් වන ඉලක්ක, පාදක දත්ත, ඉලක්ක ලඟාවිය යුතු සන්ධිස්ථාන මෙන්ම ප්‍රගතිය මැන බැලීම සඳහා දර්ශක හඳුනා ගැනීමටද කටයුතු කර නොතිබුණි. තිරසර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීම සඳහා ආයතනයේ කාර්යයභාරය හා සම්බන්ධ වන | තිරසාර සංවර්ධන අරමුණු ජාතික මට්ටමේ උපාය මාර්ග කළමණාකරණ සැලැස්මකට අනුව ආයතනිකව, පළාත්,හා ජාතික මට්ටමින් ළගාකර ගැනීම සඳහා සම්බන්ධීකරණය කිරීමට ජ්‍යෙෂ්ඨ නිලධාරීන් දෙදෙනෙකු නම් කර කුමන ආයතනයක් වෙත යැවිය යුතුද යන්න ආදිය පිළිබඳ මෙම දෙපාර්තමේන්තුව දැනුවත් කර නොතිබුණි. | තිරසර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීම සඳහා කටයුතු කල යුතු බව. |

උනන්දුවක් දක්වන පාර්ශවයන් හඳුනා ගෙන නොතිබුණි.

**5. මානව සම්පත් කළමනාකරණය**

-------------------------------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| දෙපාර්තමේන්තුවේ කොමසාරිස් තනතුර 2020 දෙසැම්බර් 23 දින සිට පුරප්පාඩුව පැවති අතර නිතී නිලධාරි තනතුර 2014 අගෝස්තු මාස සිට පුරප්පාඩුව පැවතුණි. | කොමසාරිස් තනතුරට ස්ථිර නිලධාරියෙක් පත්කර දෙන ලෙස අමාත්‍යාංශයෙන් ඉල්ලීම් කර ඇත. නීති නිලධාරි තනතුර සඳහා සම්මුඛ පරීක්ෂණ පවත්වන ලද අතර රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යැවීමට කටයුතු කර ඇත. | දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අරමුණු ඉටු කර ගැනීම සඳහා අත්‍යවශ්‍ය වන ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරුවල පුරප්පාඩු කඩිනමින් පිරවිය යුතු බව. |